# කොරෝනාවට වැට බඳින සාම්ප්‍රදායික දැනුම

**සංදීපනී එස්.ඒ.බී.එස්,[1] පුෂ්පමාලි ජේ.ඒ.ආර්,[2] කුමාරි එල්.පී.එන්.පී.[3]**

මෑත කාලීන ලෝක ප්‍රජාවට මුහුණ දීමට සිදු වූ දරුණුතම වසංගත තත්ත්වය කොරෝනා වසංගතය වේ. සාම්ප්‍රදායික දැනුම කොරෝනාව මැඩපැවැත්වීමට ප්‍රබල අවියකි. සිංහල ජන දිවියේ සාම්ප්‍රදායික දැනුම තුළින් කොරෝනා වසංගත තත්ත්වය පාලනය කළ හැක්කේ කෙසේද යන ගැටලුව ඔස්සේ මෙම පර්යේෂණය සිදුකරනු ලබයි. ඍජු නිරීක්ෂණය සහ ද්විතීක මූලාශ්‍ර ඔස්සේ දත්ත ලබාගන්නා ලදි. පර්යේෂණයේ ප්‍රධාන අරමුණ වූයේ කොවිඩ් වසංගතය සමාජ ගතවීම වැළැක්වීම සඳහා සාම්ප්‍රදායික දැනුම උපයෝගී කරගත් ආකාරය හඳුනාගැනීම වේ. කොරෝනා වසංගතය සමාජ ගතවීම වැළැක්වීම සඳහා සාම්ප්‍රදායික දැනුම යොදා ගතහැකි ආකාර හඳුනා ගැනීම, එම සාම්ප්‍රදායික දැනුමින් ලද ප්‍රතිඵල හඳුනා ගැනීම උප අරමුණු වේ. මෙහිදී කොරෝනා වසංගතය වැළැක්වීම වෙනුවෙන් දේශීය දැනුම වෙත යොමුවීමේ ප්‍රවණතාව ඉහළ ගොස් තිබේ. දුම් ඇල්ලීම හා විෂබීජහරණය, තිඹිරිගෙය, පාරම්පරික වෙදකම(නාඩි ශාස්ත්‍රය), ආයුර්වේද වෙදකම, ගොක්කොළ පෙළක් එල්ලීම, ඖෂධීය ශාකසාර අඩංගු පා දිය බඳුන හා ඖෂධීය පානයන් ආදිය සාම්ප්‍රදායික දැනුම යොදාගත් අවස්ථාවන් වේ. දුම් ඇල්ලීමට ඖෂධීය ශාකපත්‍ර ලෙස ප්‍රධාන වශයෙන් කොහොඹ, කැප්පෙටියා, නික, ආඩතෝඩා භාවිතා කරන ලදි. කොහොඹ කොළ දුමාරය ඇල්ලීම මඟින් අදාළ ස්ථානවල ජීවත්වන රෝගකාරක ක්ෂුද්‍රජීවීන් විනාශ කරනු ඇත. එමෙන්ම සෙම්ප්‍රතිශ්‍යාව, තද හිසරදය, උණ කැස්ස මර්ධනය සඳහා අතීතයේ මෙන්ම වර්තමානයේ දී ඖෂධිය ශාකපත්‍ර යොදා සදාගත් ජලය රත්කොට එහි වාෂ්පය ආශ්වාස ප්‍රාශ්වාස සිදුකරනු ලබයි. තිඹිරිගෙය ලෙස හඳුන්වන්නේ කොහොඹ ලෑලි යොදා සකසා ගත් පොළවකින් යුත් එම ලෑලිවලට යටින් අඟුරු ස්ථරයක්, හුණුගල් ස්ථරයක් හා වැලි ස්ථරයක් යොදා සකසන විෂබිජහරිත කුඩා කාමරයකි. මෙහි ආසාදිත රෝගීන් නීරෝගී පුද්ගලයින්ගෙන් වෙන්කර තබාගැනිමට යොදාගත හැක. නිරෝධායනය වන පවුලක් බව දැක්වීම සඳහා කොහොඹ කොළ සමඟ ගොක්කොළ පෙළක් කඩුල්ලේ හෝ ගේට්ටුවේ එල්ලීම සිදුකරයි. මෙය සමාජීය වශයෙන් "තහංචි" ලෙස හඳුන්වයි. වීෂබිජහරයණයෙහිලා වැඩි වශයෙන් අත් පා දෝවනයට අවධානය යොමු වි තිබේ. නිවසට එන විටත් බැහැරට යන විටත් අත් පා සෝදා ගැනීමට ඖෂධීය ශාකසාරයන් අඩංගු "පා දිය බඳුන" අතීතයේ මෙන්ම වර්තමානයේද යොදාගනී. මෙයට කොහොඹ පත් යුෂ, අමුකහ, කාබන් සංයුතිය අධික දර අඟුරු මිශ්‍ර ජලයට අමු දෙහි ගෙඩි කපා දමා සදා තිබූ මෙම දිය බඳුනේ මූලික අරමුණ වන්නේ විෂබිජහරණයයි. වසංගත රෝගයන්ට මෙන්ම බෝ නොවන රෝගයන්ගෙන් ආරක්ෂා වීමට පෝෂණයෙන් යුත් සාම්ප්‍රදායික ආහාර රටාව ද බලපානු ලබයි. එබැවින් කොරෝනා වැනි වසංගතයන් මර්ධනයට උපකාරි වන අතීතයේ සිට පැවත එන සාම්ප්‍රදායක දැනුම මියදෙන්නට නොදී රැකගත යුතුය.

**ප්‍රමුඛ පද:** සාම්ප්‍රදායික දැනුම, කොරෝනා වසංගතය, ඖෂධීය, විෂබිජහරණය, පාරම්පරික වෙදකම

[1,2,3] සමාජීයවිද්‍යා හා මානවශාස්ත්‍ර පීඨය, ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය. buddhishanika825@gmail.com